**අනුරාධපුර මහා නගර සභාව - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අනුරාධපුර මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහානගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3.7 ප්‍රකාරව මහා නගර සභාව පිළියෙල කළ අයවැය ලේඛනයක අයවැයගත තොරතුරු මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත් කළයුතු වුවත් අයවැයගත තොරතුරු රහිතව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක - 2017 පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3.7 ප්‍රකාර කටයුතු කළ යුතුවේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.781,844 ක් වුවත් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ එය රු.1,394,344 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම වත්කම් රු.612,500 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ස්ථාවර තැන්පත් පොලී ගණනය කර ඇත. | දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී නිවැරදිව ගණනය කළ යුතුවේ. |
| (ආ) | මහා නගර සභාවට සිදුව ඇති රු.4,934,124 ක්වූ හානි හා පාඩු මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී ගැලපීම් කිරීමට කටයුතු කරමි. | නිවැරදි හානි හා පාඩු වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුවේ. |
| (ඇ) | මහා නගර සභාවේ ගාර්බේජ් ට්‍රේලර් 06 ක වටිනාකම් ගණන් බලා ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර ගිනි නිවන රථ 02 ක සහ ට්‍රේලර් 13 ක වටිනාකම් සම්පූර්ණයෙන් ක්ෂය වී අවසන් වුවද එම වාහන තවදුරටත් භාවිතා කරන බැවින් එම වාහන ප්‍රත්‍යාගණනය කර ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් නැවත තක්සේරු කර ඉදිරි වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.. | වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ඉකුත් වර්ෂයේ මධ්‍යම රජයේ ආධාර යටතේ ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කළ රු.32,739,981 ක වත්කම් සහ ණයගැතියන් සහ ණයහිමියන් ලෙස ගිණුම්ගත කළ රු.19,357,320 ක බෝක්කු හා මාර්ගවල වටිනාකම් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | අදාළ ප්‍රාග්ධන වියදම් වත්කම් සහ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ණයගැතියන් සහ ණයහිමියන් ලෙස ගිණුම්ගත කළ ප්‍රාග්ධන වියදම් රු.27,339,733ක් හා පුනරාවර්තන වියදම් රු.2,625,822 ක් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ සහ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සඳහන් කර නොතිබීම නිසා ස්ථාවර වත්කම් වටිනාකම හා ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම රු.27,339,733 කින් හා පුනරාවර්තන ප්‍රදාන රු.2,625,822 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්තන වියදම් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ නිවැරදිව සටහන් කළ යුතුවේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් රු.3,209,146 ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්තන වියදම් සටහන් කිරීමට කටයුතු කරමි. | ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්තන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් රු.32,391,108 ක් දරා ගොඩනැගූ ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන තුළින් ඉදිරිපත් කරමි. | සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රාග්ධන වියදම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ පරිත්‍යාග ලැබීම් රු.48,080,074 ක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන ප්‍රදාන රු.74,735,898 ක් වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ එය රු.13,221,590 ක් ලෙස රු.61,514,308 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඒ) | අතිරික්තයේ හෝ ඌණතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වටිනාකම රු.3,397,025 ක් වුවත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ එය රු.1,935,732 ක් ලෙස රු.1,461,293 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | ජ'නල් සටහන් මගින් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සහතික නොකළ හා ඉටුනොකළ වැඩවල වටිනාකම් රු.79,030,894 ක් ණයගැති සහ ණයහිමි ලෙසට ගිණුම්ගත කර තිබුණි. | මෙම වටිනාකම් ඉවත්කිරීමට කටයුතු කරමි. | සහතික නොකළ හා ඉටුනොකළ වැඩ ගිණුම්ගත නොකළ යුතුවේ. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයිතම 19 ක මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම් සහ උපලේඛනවල සඳහන් වටිනාකම් අතර රු.10,976,143,439 ක වෙනසක් විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වෙනසට හේතුව සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.2,683,312 ක්වූ නිවාස කුලී ණයගැතියන් තහවුරු කර ගැනීමට උපලේඛන සහ අනෙකුත් ලියවිලි ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂ තහවුරු කර ගැනීම සඳහා උපලේඛන සකස් කර විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | නිවාස කුලී ණයගැති වටිනාකම තහවුරු කිරීමට අදාළ උපලේඛන හා වෙනත් ලියවිලි විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. |

**1.6 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5.3.1 සහ 7.2 වගන්ති | 2016 ජුනි 21 දින සිට ස්ථානමාරුවීගිය හිටපු නාගරික කොමසාරිස්වරයා නිල නිවස භාරදී නොමැති අතර ඔහු එම නිවසේ පදිංචි වීම වෙනුවෙන් 2009 නොවැම්බර් සිට 2016 ජුනි දක්වා රු.201,017 ක්ද 2020 ජනවාරි 01 සිට 2022 මාර්තු දක්වා රු228,033 ක්ද නිවාස කුලී ලෙස අයවී නොතිබුණු අතර නිල නිවසේ අනුමැතියක් රහිතව රැදී සිටින (2016 ජුලි | අදහස් දක්වා නොමැත. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5.3.1 සහ 7.2 වගන්ති අනුව කටයුතු කළ යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | සිට 2022 මාර්තු වාර්තාවේ දින දක්වා) කාලයට රු.376,643 ක දණ්ඩන කුලීද අයකරගෙන නොතිබුණි. මේ සම්බන්ධව 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යටතේ කටයුතු කිරීමද සිදුකර නොතිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 756 | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණය සිදුකර වාර්තාව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 756 අනුව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 30/2016 දරන චක්‍රලේඛය | සභාව සතු සක්‍රීය වාහන 36 ක ඉන්ධන දහන පරීක්ෂාවක් කර නොතිබුණි. | ඉන්ධන ගැටළුව විසඳීමෙන් පසු ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කරමි. | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ අයභාරය රු.46,807,370 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ අයභාරය රු.46,960,582 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුරාධපුර මහා නගර සභාවේ ජංගම ගිණුම් 06 කට අදාළව තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ වටිනාකම රු.2,466,494 ක්වූ චෙක්පත් 23 ක් සම්බන්ධයෙන් හේතු සොයා බලා කටයුතු කර නොතිබුණි. | තොරතුරු සොයා ගැනීමට අපහසු බැවින් මේ සඳහා තීරණ ගැනීමට කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. | එම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 189 යෙහි විධිවිධාන අනුව කඩිනමින් කටයුතු කළයුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජංගම ගිණුම් 06 කට අදාළව අවස්ථා 16 කදී ලැබී තිබූ සෘජු තැන්පත් රු.6,553,801 ක් හඳුනා ගෙන ආදායම් විෂයයන්ට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | බොහොමයක් ලැබීම් නිවැරදිව හඳුනාගෙන මුදල් පොතේ සටහන් කර ඇත. | අදාළ සෘජු තැන්පත් හඳුනාගෙන ආදායම් විෂයයන්ට බැර කළ යුතුවේ. |

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.112,725,978 ක්වූ හිඟ වරිපනම් බදු ආදායම අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය හමුවේ අදාළ මුදල් අයකර ගැනීමට නොහැකි විය. | මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | **කුලී** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.58,550,284 ක්වූ හිඟ කුලී අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | රට තුළ පවත්නා කොරෝනා වසංගත තත්ත්වය හමුවේ හිඟ මුදල් අයකර ගැනීමට නොහැකි විය. | කඩිනමින් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| **(ඇ)** | බලපත්‍ර ගාස්තු | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,200,200 ක් වූ වෙළඳ බලපත්‍ර ආදායම අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් බලපත්‍ර ගාස්තු අයකර ගැනීම පහළ මට්ටමක පැවති අතර බලපත්‍ර නොගෙවන ව්‍යාපාර සඳහා නඩු පැවරීමට කටයුතු කර ඇත. | ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| **(ඇ)** | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ රු.1,182,193 ක් හා මුද්දර ගාස්තු රු.21,242,282 ක් අයකරගෙන නොතිබුණි . | අයකර ගැනීමට ඇති උසාවි දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | අයකර ගැනීමට ඇති උසාවි දඩ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කීරික්කුලම පිළිසරු ව්‍යාපෘතිය සඳහා යොදවා තිබූ එක්ස්කැවේටර් යන්ත්‍රය 2014 සැප්තැම්බර් 18 දින ගිණි ගැනීම සම්බන්ධයෙන් විධිමත් මු.රෙ. 104 පරීක්ෂණයක් පවත්වා රුපියල් මිලියන 3.3 ක් වූ අලාභයට වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන එම නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි. | විමර්ශන වාර්තා නිර්දේශ කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් අනුමැතිය හෝ විධිමත් විනය නියෝගයක් ලබාදී නොමැත. | මු.රෙ. 104 අනුව පරීක්ෂණ කඩිනමින් නිමකර එම නිර්දේශ අනුව කටයුතු කළයුතු වේ. |
| (ආ) | 2012 සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ මහ නගර සභාවේ සිදුවී තිබුණු අක්‍රමිකතාවයන් දෙකකින් සභා අරමුදලට සිදුවී තිබුණු රු.47,174,493 ක මූල්‍යමය අලාභය සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනිමට නොහැකිවී තිබුණි. | සිදුවූ අලාභයෙන් රු.64,164 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | මූල්‍යමය අලාභය අදාළ පාර්ශවයන්ගෙන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | මහා නගර සභාවේ සේවය කර 2013 වර්ෂයේදී වෙනත් ආයතනයකට ස්ථානමාරුවී ගොස් තිබුණු සේවකයෙකුට ස්ථානමාරුවී ගිය දින සිට 2018 ජුනි මස දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් වැටුප් සහ දීමනා ලෙස රු.1,816,557 ක ගෙවීම් කර තිබීම නිසා සභා අරමුදලට සිදුවී තිබුණු මූල්‍යමය අලාභය මූලික විමර්ශන වාර්තාවලින්ද තහවුරු වී තිබුණු නමුත් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මීට අදාළ විනය පරීක්ෂණ අවසන් වූ පසු විනය නියෝග අනුව ප්‍රධාන අමාත්‍යාංශය මගින් ඉදිරි කටයුතු සිදුකරනු ඇත. | මූලික විමර්ශන වාර්තාවලින් තහවුරු වූ මූල්‍යමය අලාභය අදාළ පාර්ශවයන්ගෙන් හැකි ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | වර්ෂ 02 ත් 07 ත් අතර කාලපරිච්ඡේදය තුළ අදාළ පාර්ශවයන්ට ගෙවා නිදහස් නොකොට රඳවා තබාගෙන ඇති රු.7,635,205 ක තැන්පත් ශේෂයක් ගෙවා නිරවුල් කිරීමට 2021 වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | මෙම තැන්පතු ශේෂ නිරවුල් කර නොහැකි ශේෂයකි. | ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඉ) | වර්ෂ 02 කට වඩා පැරණි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.118,717 ක් සමාලෝචිත වර්ෂය තුළදීද ගෙවීමට කටයුතු කර නොතිබුණි. | දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන බදු මුදල් ගෙවීම සම්බන්ධයෙන් කටයුතු සිදුකරමින් පවතී. | මුදල් ගෙවා ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඊ) | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට 2019 වර්ෂයේ සිට ගෙවිය යුතු රු.489,760 ක් සහ වෙනත් ණයහිමියන්ට ගෙවිය යුතු රු.1,426,907 ක් ගෙවා නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | ණයහිමියන් සඳහා මුදල් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කරමි. | ණයහිමි ශේෂ කඩිනමින් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (උ) | 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ගෙවිය යුතු විගණන ගාස්තු රු.4,243,250 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | සභා තීරණය පරිදි ගෙවිය යුතු විගණන ගාස්තු ගෙවීමට කටයුතු කරමි. | විගණන ගාස්තු කඩිනමින් ගෙවීමට කටයුතු කළ යුතුවේ. |
| (ඌ) | මහා නගර සභාවේ යන්ත්‍ර සහ ගලි බවුසරය මුදල් අයකර ගැනීමකින් තොරව ලබාදීම නිසා 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.864,840 ක් අයවී නොතිබුණි. | මෙම වර්ෂය අවසන් වීමට පෙර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | අයකර ගැනීමට ඇති හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (එ) | මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව වසර 05 ක් ඉක්මවූ කාලයක සිට පැවත එන රු.3,029,562 ක ලැබිය යුතු ණය ශේෂ 02 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබූ අතර එම ණය ශේෂ අයවිය යුතු පාර්ශවයන්ද හඳුනාගෙන නොතිබුණි. | මෙම වර්ෂය තුළදී ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | ණය ශේෂ අයවිය යුතු පාර්ශවයන් හඳුනාගෙන ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඒ) | වසර 02-03 ත් ඉක්මවූ කාලයක සිට ගෙවිය යුතුව පවතින රු.718,717 ක ණය ශේෂ 03 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ගෙවීම් සිදුකිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු පාර්ශව හඳුනාගෙන ගෙවීම් කටයුතු සිදුකළ යුතුවේ. |
| (ඔ) | නීති අංශයේ වාර්තාවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව පාර්ශව 29 ක්ද සභාව විසින් බාහිර පාර්ශව 04 කට එරෙහිවද නඩු පවරා තිබුණු නමුත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | අසම්භාව්‍ය වත්කම් සහ බැරකම් මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කළ යුතුවේ. |